අග්‍රාමාත්‍ය කාර්යාලය
பிரதம அமைச்சரின் அலுவலகம்
PRIME MINISTER'S OFFICE

58, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත, කොළඹ 07.
58, ஸ்ரீமத் ஏர்னஸ்ட் த சில்வா மாவத்தை, கொழும்பு 07.
58, Sir Ernest de Silva Mawatha, Colombo 07.

මගේ යොමුව / எனது குறியீடு / My Ref. PTF/01/Circular/01

ඔබේ යොමුව / உமது குறியீடு / Your Ref.

දිනය / திகதி / Date 2020.04.20

චක්‍රලේඛ අංකය : PTF/03/2020 (iv)

**සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්**

**සහ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත**

**<u>උද්ගත වී ඇති ව්‍යසනකාරී තත්ත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ පොරොත්තු ලේඛන ගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු.5000/- ක දීමනාවක් ගෙවීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක PTF/03/2020 හා 2020.03.31 දිනැති චක්‍රලේඛය සහ ඊට අනුෂාංගික චක්‍රලේඛ මඟින් ලබා දී ඇති උපදෙස්වලට වැඩිමනත් වශයෙනි.

**02.** ඉහත සඳහන් චක්‍රලේඛ අනුව දැනටමත් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කර ඇතත්, එක් එක් පවුල් ඒකකය තුළ සිටින අනු පවුල්, රැකියා සඳහා විදේශගත වූ පුද්ගලයින් සිටින පවුල් ඒකක, ඇඟළුම් ඇතුළු විවිධ පෞද්ගලික අංශයේ කර්මාන්තවල සේවයේ නියුතු වූවන් සිටින පවුල් ඒකක ද, පවතින තත්ත්වය හේතුවෙන් ජීවත් වීමට ප්‍රමාණවත් ආදායම් තත්ත්වයක් නොමැති බව පවසමින් මෙම දීමනාව ඔවුන්ට ද ගෙවන ලෙසට අතිගරු ජනාධිපතිතුමා සහ ගරු අග්‍රාමාත්‍යතුමා වෙත ඉල්ලීම් ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීම් ධනාත්මකව සලකා බැලීමට ජනාධිපති කාර්යසාධන බලකාය තීරණය කර ඇත.

**03.** එවැනි පවුල් ඒකක වෙත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා, අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකියාවක් ඇති අතර, ඔවුන් විසින් ම සකස් කළ එම අභියාචනය සියලු විස්තර සහිතව ග්‍රාමීය කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය. ග්‍රාමීය කමිටුවේ නිර්දේශය සහිතව එම අභියාචනය ප්‍රදේශීය ලේකම් වෙත ඉදිරිපත් කළ පසු ප්‍රාදේශීය ලේකම් විසින් ඒ සම්බන්ධයෙන් කරුණු පරීක්ෂා කර බලා අවසන් තීරණයක් ලබා දිය යුතුය. මෙහි දි පහත වගුවේ දක්වා ඇති උපදෙස් සැලකිල්ලට ගත යුතු ය.

| අනු අංකය | ගෙවීම් කිරීමට යෝජිත පවුල් | උපදෙස් |
|---|---|---|
| 01 | අනු පවුල් සඳහා ප්‍රතිලාභ ගෙවීම | ඡන්දහිමි නාම ලේඛනයේ එක් ගෘහ මූලික අංකයක් යටතේ ලියාපදිංචි වී තිබුන ද, එම ගෘහ මූලික ඒකකයේ ප්‍රධාන පවුල් ඒකකයට අමතරව එක් අනු පවුලක් හෝ ඊට වැඩි ගණනක් සිටීනම් එම එක් එක් අනු පවුල්, පවතින තත්ත්වය හේතුවෙන් ජීවනෝපාය අහිමි වීම මත ප්‍රතිලාභ ලැබීමට සුදුසු යැයි ග්‍රාමීය කමිටුව තීරණය කරන්නේ නම් එසේ ප්‍රතිලාභ ගෙවීමට සලකා බැලිය හැකි ය. |
| 02 | විදේශ රැකියා සඳහා විදේශගත වූ පුද්ගලයින් සිටින පවුල් සඳහා ගෙවීම | ප්‍රධාන පවුල් ඒකකයේ හෝ අනු පවුල් ඒකකයේ සාමාජිකයෙකු හෝ සාමාජිකයින් විදේශගත වී සිටිය ද, එම විදේශ රටේ පවතින තත්ත්වය අනුව, එම පවුල් ඒකකයට මුදල් එවීමට හැකියාවක් නොමැතිනම් හා එම පවුල් ඒකකවල පෙර මුදල් ඉතුරුම් නොමැතිවීම යන කරුණු සැලකිල්ලට ගෙන දීමනා ගෙවීමට සලකා බැලිය හැකිය. එහිදී, විදේශගත වූ සාමාජිකයා/සාමාජිකයින් මුදල් නොඑවන ලද බවට හා පෙර ඉතුරුම් නොමැති බවට තහවුරු කර ගැනීමෙන් පසු ප්‍රතිලාභ ගෙවීමට සලකා බැලිය හැකි ය. |
| 03 | ඇඟළුම් ඇතුළු විවිධ පෞද්ගලික අංශයේ රැකියාවේ නියුතු පුද්ගලයින් සිටින පවුල් ඒකක සඳහා ගෙවීම | මෙවැනි පවුල් ඒකකවලට ගෙවීම් සිදු කිරීමේ දී අප්‍රේල් මස වැටුප නොගෙවූ බවට/ගෙවූ වැටුප රු.5000/= ට වඩා අඩු බවට තහවුරු කර ගැනීමෙන් පසු එසේ අඩු වූ මුදල ප්‍රතිලාභ වශයෙන් ගෙවීමට සලකා බැලිය හැකි ය. |
| 04 | විශ්‍රාම වැටුප රු.5000/=ට වඩා අඩු මුදලක් ලැබූ අය | දැනට කුමන හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයකින් විශ්‍රාම වැටුප් ලබන හා එම විශ්‍රාම වැටුප රු.5000/=ට වඩා අඩු විශ්‍රාමිකයන් හට ඊට අදාළ තොරතුරු ඉදිරිපත් කරමින් සිදු කරනු ලබන අභියාචනා සලකා බලා එසේ අඩු වූ මුදල ප්‍රතිලාභ වශයෙන් ගෙවීමට සලකා බැලිය හැකි ය. |
| 05 | වැවිලි ක්ෂේත්‍රයේ රැකියාවල නියුතු පුද්ගලයින් සිටින පවුල් ඒකක සඳහා ගෙවීම | වැවිලි ක්ෂේත්‍රයේ අනියම්/ආදේශක/තාවකාලික පදනමින් සේවය කරන, සිය දෛනික/මාසික ආදායම අහිමි වූ පවුල් ඒකක සඳහා ද මෙම ප්‍රතිලාභය ගෙවීමට සලකා බැලිය හැකි ය. |
| 06 | මේ වන තෙක් රු. 5,000 දීමනාව නොලැබූ පවුල් ඒකක | මෙම ප්‍රතිලාභ වැඩසටහන යටතේ ප්‍රතිලාභ ලැබීමට සුදුසු එහෙත්, මේ වන තෙක් ප්‍රතිලාභ ලැබීමට තෝරා ගෙන නොමැති පවුල් ඒකකයක් වේ නම්, ඔවුන්ගෙන් අභියාචනයක් ලබා ගෙන ප්‍රතිලාභ ගෙවීමට සලකා බැලිය හැකි ය. |

**04.** ඉහත සඳහන් කළ ප්‍රතිලාභීන් සඳහා වූ ප්‍රතිලාභ ගෙවීම ද 2020 අප්‍රේල් මස 22 දින වන විට ගෙවා අවසන් කළ යුතු ය.

**05.** උද්ගතව ඇති තීරණාත්මක තත්ත්වය යටතේ ශ්‍රීලාංකේය ජනතාවට සාමාන්‍ය ජන ජීවිතය යථා පරිදි පවත්වාගෙන යාම සඳහා ඔබ විසින් ඉටු කරනු ලබන මෙහෙය කෘතවේදීව අගය කරමි.

**ගාමිණී එස්. සෙනරත්**
අග්‍රාමාත්‍ය ලේකම්
ප්‍රධාන මෙහෙයුම් නිලධාරි - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම,
සම්බන්ධීකරණය හා පසුවිපරම පිණිස වූ ජනාධිපති කාර්යසාධන බලකාය

පිටපත්:

| | |
|---|---|
| 01. ජනාධිපති ලේකම් | කාරුණික දැන ගැනීම සඳහා |
| 02. අමාත්‍ය මණ්ඩල ලේකම් | |
| 03. විගණකාධිපති | |
| 04. ලේකම්, මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | අවශ්‍ය කටයුතු සඳහා |
| 05. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | |
| 06. ලේකම්, කාන්තා හා ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | |